## සරත් ෆොන්සේකා සිද්ධියෙන් පාඩමක්

මේ ලිපිය ලියන මොහොත වන විට සරත් ෆොන්සේකා මහතා කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව ඇමරිකා එක්සත් ජනපදයෙන් පිට වී ඇති බව වාර්තා වෙයි. ලංකාණ්ඩුව ඒ මහතාට එසේ පිටවී ආපසු එමට උපදෙස් දී ඇති බව ද ඇ ඒ ජනපදයට බලපෑම් කර ඇති බව ද පැහැදිලි ය. ඇ ඒ ජ ෆොන්සේකා මහතාට එසේ පිට වී යෑමට ඉඩ දුන්නේ ඔවුන්ට කළු බලපෑම් හේතුවෙන් මිස ඒ මහතාගෙන් ප්‍රශ්න කිරීම නොමනා ක්‍රියාවක් යැයි ඔවුන්ට අවබෝධ වූ නිසා නො වේ. ෆොන්සේකා මහතාගෙන් ගෝඨාභය රාජපක්ෂ මහතා පිළිබඳ ව ප්‍රශ්න කිරීමට යන බව මෙරට තානාපති අංශ ඔස්සේ ලංකාණ්ඩුවට දැන්වීමට කටයුතු කෙළේ හිටපු හමුදාපතිවරයා ම වීම මෙහි දී කැපී පෙනෙන කරුණකි.

ලංකාණ්ඩුවට නොදන්වා එසේ ප්‍රශ්න කිරීම්වලට භාජනය වීමට ෆොන්සේකා මහතාට ඉඩ තිබූ නමුත් ඒ මහතා එසේ නො කෙළේ ය. එසේ නොකිරීම ඒ මහතාගේ ගෞරවයට හේතුවෙයි. ලංකාණ්ඩුව ද ප්‍රශ්න කිරීම ගැන දැනගත් මොහොතේ සිට ක්‍රියාත්මක විය. ඇ ඒ ජනපද ආණ්ඩුවට හා බලධාරීන්ට තම විරෝධය පළ කළ ලංකාණ්ඩුව ෆොන්සේකා මහතා ප්‍රශ්න කිරීමකින් තොරව ආපසු ගෙන්වා ගැනීමට ක්‍රියා කෙළේ ය. අවසානයේ දී ඇ ඒ ජනපද ආණ්ඩුවට ප්‍රශ්න කිරීම් අකුළා ගැනීමට සිදු විය.

බටහිර රටවල් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට හා හමුදා නිලධාරීන්ට එරෙහිව ඊනියා යුද්ධ අපරාධ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය හැකි බව අප මේ තීරුවෙන් පෙන්වා දුන්නේ යුද්ධ අපරාධ ගැන සාකච්ඡා නොවූ කාලයක ය. එපමණක් නොව මහින්ද රාජපක්ෂ මහතා බටහිර රටවල සංචාරය කිරීමේ අවදානමක් ඇති බව පෙන්වා දුන් අපි ඒ මහතා එසේ සංචාරය නොකරන්නේ නම් මැනවි යැයි ද කීවෙමු. බොහෝ දෙනාට මේ කරුණු අමතකවන්නේ අවාසනාවකට වුවත් සිංහල සංස්කෘතියේ අංගයක් ලෙසිනි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පිළිබඳ අපට අපේ ම වූ ප්‍රවාද ඇත. ඒ ප්‍රවාද අප ගොඩනගා ඇත්තේ සිංහල බෞද්ධ චින්තනයෙහි පදනම් වෙමිනි. එකිනෙකින් ස්වායත්ත නොවූ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සංරචක ඔස්සේ ක්‍රියාත්මක වන බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදය අවුරුදු පන්සියයකට වැඩි කාලයක් තිස්සේ මුළු ලෝකය පුරාම ඔවුන්ගේ සංස්කෘතිය, ආර්ථික රටාව හා දේශපාලන ව්‍යූහ ප්‍රචලිත කිරීමට උත්සාහ කරයි. බටහිරයන්ට ඇත්තේ හුදු ආර්ථික හා දේශපාලන වුවමනාවන් පමණක් නොවන බව අපේ මූලික ප්‍රස්තුතයක් වෙයි. වෙනත් අය මෙන් නොව බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි සංස්කෘතික සංරචකය ද අපි සැලකිල්ලට ගනිමු. ඇතැමුන් ඒ සංස්කෘතික ඌනිතවාදයක් ලෙස දකින්නේ අපේ ප්‍රවාද අවතක්සේරු කිරීමට බව අපි දනිමු.

මෙරට දෙමළ ජාතිවාදය පනස්හයෙන් පසුව ඇතිවූවක් ය යන මිථ්‍යාව හෙළිදරව් කළ අපි එහි ආරම්භය හා විකාශය ලන්දේසීන් මුහුදුබඩ පෙදෙස් පාලනය කළ කාලය දක්වා ගෙන ගියෙමු. ඒ සම්බන්ධයෙන් ලියැවුණු සාහිත්‍යයක් අප සතු වන අතර මෙරට අඛණ්ඩ දෙමළ ඉතිහාසය ද ඒ කාලයෙන් ඔබ්බට නොයන බව පෙන්වීමට සමත්වීමු. විශේෂයෙන් ම යාපනයේ වත්මන් ජනගහණය වැඩිවශයෙන් පැවතෙන්නේ ලන්දේසීන් මෙරටට ආනයනය කළ වෙල්ලාලයන්ගෙන් බව කියා සිටියෙමු. බටහිරයන් මෙරට සිංහලත්වයට හිමි තැන අහිමි කිරීම සඳහා මුල සිට ම ඔවුන් විසින් නිර්මාණය කරන ලද දෙමළ ජාතිවාදය යොදාගෙන ඇති ආකාරය ද අපි පෙන්නුම් කෙළෙමු. එසේ ම ක්‍රොට් සංවිධානය පසුපස ඇති බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදය ද අපි හෙළිදරව් කෙළෙමු. මෙහි අතුරු කතාවක් ලෙස බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය විසින් තම ආර්ථික හා සංස්කෘතික ආධිපත්‍යය පැතිරවීමට හා තහවුරු කිරීමට බටහිරින් ම යැපෙන ඊනියා රාජ්‍ය නොවන සංවිධාන යොදා ගැනෙන ආකාරය ද අපි විස්තර කෙළෙමු. ඊනියා රාජ්‍ය නොවන සංවිධාන යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයෙහි ප්‍රබල ආයුධයකි.

මේ සියල්ල අපේ ප්‍රවාද මගින් කියැවුණු අතර ඒ නව නිර්මාණ විය. අනගාරික ධර්මපාලතුමාගෙන් පසුව ජාතික චින්තනයෙන් බිහි වී ඇති කිසිවක් නොමැති බව කියන පඬියන්ට ඒ පිළිතුරක් විය. අනෙක් අතට බටහිර මතිමතාන්තර හැරෙන්නට වෙනත් කිසිවක් නොදත් පුස්සන් කියන පරිදි නොව ඒ කිසිවක් සුද්දන්ට විරුද්ධව කෙරුණු ඊනියා චණ්ඩි කතා නො වී ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා යටත්විජිතවාදය ගැන අප සතුව තිබූ දැනුම (අපේ

© Prof. Nalin De Silva

ප්‍රවාද) සමග ඊනියා යුද්ධ අපරාධ චෝදනාව ජනාධිපතිතුමාට හා සෙසු අයට එල්ලවන බව දැනගැනීමට අපට අපහසුවක් නො විණි.

විසිවැනි සියවසේ අගභාගයේ තම වීරයා වූ ප්‍රභාකරන් මරාදැමීම පිළිබඳ ව බටහිරයන්ට ඇත්තේ තදබල කෝපයක් බව අමුතුවෙන් කිවයුතු නො වේ. සිංහලත්වය දුර්වල කිරීමට, හැකිනම් නැතිකිරීමට බටහිරයන් යොදාගත් දෙමළ ජාතිවාදයේ අංශයක් වූ දෙමළ ත්‍රස්තවාදය පරාජයකිරීම පිළිබඳ ව බටහිරයන් වියරුවැටී සිටින බව රහසක් නො වේ. බටහිරයන් අපට කරන කෙණෙහිලිකම්වල කෙළවරක් නැත. මෙරට විනිශ්චයකරුවන් කිහිප දෙනකු ෆිජී දූපතට යෑමේ දී ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය ක්‍රියාකළ ආකාරය මේ සම්බන්ධයෙන් ඇති ආසන්න ම උදාහරණය වෙයි. ඒ සිද්ධිය මුල්කරගෙන ෆිජි ආණ්ඩුව එරට ඕස්ට්‍රේලියානු හා නවසීලන්ත තානාපතිවරුන්ට ආපසු යෑමට අණකර ඇත.

සරත් ෆොන්සේකා මහතා හා ආණ්ඩුව අතර යම් විරසකයක් ඇති බව රටටවත් අවශේෂ ලෝකයටවත් රහසක් නො වේ. බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයේ මෙරට තවත් නියෝජිතයකු වූ රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ පිරිස (පසුගිය දා ඊනියා සංධානයකට එළඹුණු ම. සමරවීර, රා. හකීම්, මනෝ ගනේෂන් ආදීහු) ප්‍රභාකරන්ගේ සිංහල හා මුස්ලිම් මස්සිනාලා වෙති. ප්‍රභාකරන් මෙන් ම ඔවුහු ද බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි සුවච සේවකයෝ පමණක් වෙති. මේ අය ද බටහිරයෝ ද ඒ විරසකය ඔස්සේ ආණ්ඩුවට විරුද්ධව සරත් ෆොන්සේකා මහතා යොදා ගැනීමට උත්සාහ කරති. ප්‍රභාකරන්ගේ සිංහල හා මුස්ලිම් මස්සිනාලා සරත් ෆොන්සේකා මහතා ජනාධිපතිවරණයේ දී ඊනියා පොදු අපේක්ෂකයා බවට පත්කර ගැනීමට උත්සාහ ගන්නේ තමන්ට ජයගත හැකි අපේක්ෂකයකු නැතිවීම, මහින්ද රාජපක්ෂ මහතාගේ ඡන්ද යම් ප්‍රමාණයකින් වුවත් අඩුකිරීම හා අවසානයේ දී සරත් ෆොන්සේකා මහතාගේ කීර්තිය නැතිකිරීම මුල්කරගෙන ය. කලින් කී විරසකය නොවන්නට මේ මස්සිනාලාට එවැනි උත්සාහයක් ගැනීමටවත් නොහැකිවනු ඇත. ඇ එ ජ සරත් ෆොන්සේකා මහතාගෙන් ප්‍රශ්නකිරීමට සූදානම් වූ අවස්ථාවේ දී ප්‍රභාකරන්ගේ මස්සිනාලාගේ සංධානය ඒ මහතා වෙනුවෙන් කුමක් කෙළේ ද? පිළිතුර කිසිවක් නැත යන්න ය.

ඇ එ ජනපද ආණ්ඩුව ද සරත් ෆොන්සේකා මහතා ලවා තොරතුරු ලබාගැනීමට උත්සාහ කෙළේ විරසකය මුල්කරගෙන ය. ෆොන්සේකා මහතාට එරට පුරවැසිකම ලබාගැනීමේ හැකියාවක් ඇත. එසේ පුරවැසිකම ලබාගත හැකි පුද්ගලයකු ලවා වෙනත් ආණ්ඩුවකට විරුද්ධව තොරතුරු ලබාගැනීමට තැත්කෙළේ නම් ඇ එ ජ ආණ්ඩුව තම පුරවැසියන් විදේශීය රටවල ඔත්තුබලන්නන් ලෙස යොදාගැනීමට සූදානම් බව පෙන්නුම් කෙළේ ය. අනෙක් අතට ඔවුන් ෆොන්සේකා මහතාගෙන් තොරතුරු ලබාගැනීමට උත්සාහ කෙළේ  හමුදා නිලධාරියකු ලෙස නම් ඇ එ ජ ලංකාවට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කරන තත්වයකට ආසන්න තත්වයකට පත්වීමට තිබුණි. වෙනත් රටක හමුදා නිලධාරියකු බලය යොදා ඒ රටට විරුද්ධව යොදා ගැනීම යුද්ධ ප්‍රකාශ කරන තත්වයකට ආසන්න තත්වයකි. ඇ එ ජ අවසාන මොහොතේ දී හෝ සරත් ෆොන්සේකා මහතාගෙන් ප්‍රශ්න නොකිරීමට තීරණය කිරීමෙන් ජාත්‍යන්තර ව ඇතිවීමට තිබු අර්බුදයක් තාවකාලික ව නැති වී ගියේ ය.

එහෙත් අර්බුදය මුළුමනින් ම පහව ගොස් නැත. අප කලින් කියා ඇති පරිදි දෙමළ ජාතිවාදය හා බෙදුම්වාදය තවමත් ක්‍රියාත්මක වෙයි. විශේෂයෙන් ම බටහිර රටවල සිටින විසිරුණු දෙමළ ජනයා එහි දී බටහිරයන් විසින් යොදා ගැනෙති. අද ඇතැම් පඬියන් (ප්‍රභාකරන් පැරදවීමට නොහැකි යැයි එදා කීවෝ ද ඔවුහුම ය.) ඊනියා නැවත සංවිධානයවීම් (රීග්‍රෑපින්) යැයි කියන්නේ අප එදා ද කී මේ ප්‍රවණතාවට ය. ජනාධිපතිතුමා ද සරත් ෆොන්සේකා මහතා ද දෙමළ ජාතිවාදයේ හා බෙදුම්වාදයේ ක්‍රියාකාරීත්වය ගැන දනිති. අපට දෙමළ ත්‍රස්තවාදය පරාජය කළ හැකි වුයේ පළමුව ජනාධිපතිතුමාගේ දේශපාලන නායකත්වය, දෙවනුව ආරක්ෂක ලේකම්තුමාගේ අප්‍රතිහත ධෛර්යය හා අධිෂ්ඨානය හා තුන්වැනුව එවකට හමුදාපති ව සිටි  සරත් ෆොන්සේකා මහතාගේ හමුදා මෙහෙයවීම් හා හතරවැනුව රණවිරුවන්ගේ කැපකිරීම් හේතුකොටගෙන ය. අද ද ඇ එ ජනපදයේ උපක්‍රමය වැරදී ගියේ ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා හා සරත් ෆොන්සේකා මහතා එකට ක්‍රියාකිරීම නිසා ය.  මතුවට ද ඒ එක්ව ක්‍රියාකිරීම අවශ්‍ය වෙයි. ඒ අතර බටහිර ආධිපත්‍යයට එරෙහිව ප්‍රබල ජාත්‍යන්තර සංවිධානයක් ගොඩනැගීම ද කළ යුතු වෙයි. මහින්ද රාජපක්ෂ මහතාට එහි දී විශේෂ කාර්යභාරයක් ඉටුකළ හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva